(c) www.sinhalalyrics.com

ප්‍රේමයේ රුදුරු බව එයයි
මිදියුෂ යැයි හලා හල
විෂ බිව්වේ ඇයි මා
පෙම්දැල මත පැටලී සුසුම් ලා
මුලා වුනේ ඇයි මා
ප්‍රේමයේ මධුර බව මෙයයි
ඔබයි රම්‍ය සඳකිරණ ගන අන්ධකාරයේ

ඔබයි රම්‍ය සඳකිරණ ගන අන්ධකාරේ
ඔබයි සෞම්‍ය තුරුළිය ගිම්හාන කාලේ

සදානන්ද කරවූ ඔබේ මධුර රාවෙන්
පිපී ආම් අරවින්දයක් සේ තඩාගේ
ප්‍රේමය නම් කිමැයි ඔබ මට කියා දුන්නේය
දැන් මගේ පරමාර්ථය ඔබය
මගේ පරමාදර්ශය ඔබය
මගේ ඒකායන ප්‍රාර්ථනයද ඔබය

උදාවූ සුපෙම් දම් මුසුන් වී රුදේවා
මගේ පුංචි ලෝකේ තැවුල් දුක් නොවේවා
ප්‍රේමයේ ද්වාරය ඔබ මට විවර කලෙහිය
දැන් මගේ අතීතය ඔබය
මගේ වර්තමානය ඔබය
මගේ උත්තරීතර අනාගතයද ඔබය

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - එච්. එම්. ජයවර්ධන

(c) www.sinhalalyrics.com